# ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2024 ජූනි 05- මාධ්‍ය නිවේදනය

1972 ජූනි 5 සිට 16 දින දක්වා ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර පැවැති මානව පරිසරය සුරැකීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සමුළුවේ සමාරම්භක දිනය සනිටුහන් කිරීම සඳහා සෑම වසරකම ජූනි 05 වන දින ජගත් පරිසර දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ඇත.

එතැන් සිට දශක පහකට වැඩි කාලයක් පරිසරය ආරක්ෂා කර සංරක්ෂණය කිරීම පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමට හා දිනෙන් දින පැන නගින ගෝලීය පාරිසරික ගැටළු පිළිබඳව ලෝක නායකයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරීමේ අරමුණින්, එක් එක් වර්ෂයන්හිදී විශේෂිත තේමා යටතේ ජගත් පරිසර දිනය සමරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් මෙම වසරේ ජගත් පරිසර දින තේමාව ලෙස Land Restoration, Desertification and Drought Resilience යන්න ඉදිරිපත් කර ඇත. ඒ අනුව **" ඵලදායී භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක්"** යන ජාතික තේමාව යටතේ මෙම වසරේ ජගත් පරිසර දිනය සැමරීම පිණිස කටයුතු සුදානම් වෙමින් පවතී.

නියඟය සහ කාන්තාරීකරණය වර්තමානය වන විට ලෝකයේ ප්‍රබල පාරිසරික ගැටලුවක් බවට පත්ව ඇත. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO) විසින් 2021 වර්ෂය සඳහා නිකුත් කරන ලද ගෝලීය දේශගුණ තත්ත්වය පිළිබඳ වාර්තාවට අනුව පසුගිය වසර 7 ලොව වාර්තාගත උණුසුම්ම කාලය ලෙස වාර්තා කර ඇත. එසේම එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය පිටුදැකීමේ සම්මුතිය පෙන්වා දෙන පරිදි වර්තමානය වන විට පෘථිවියේ භූමි ප්‍රමාණයෙන් 40% ක් පමණ හායනය ලක් වී ඇති අතර, එය ලෝක ජනගහනයෙන් අඩකට සෘජුවම බලපෑම් ඇති කර තිබෙන බවත්, මෙහි මූල්‍යමය බලපෑම ලෙස ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් අඩක් පමණ (ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 44) බවට ගණන් බලා ඇත. නියඟ පවත්නා කාලසීමාවන් සැලකීමේදී 2000 වර්ෂයේ සිට මේ දක්වා එය 29% කින් පමණ වර්ධනයක් පෙන්නුම් කරන අතර, 2050 වන විට ලෝක ජනගහනයෙන් ¾ කට පමණ බලපෑම් ඇති කළ හැකි බවටද පුරෝකතනය කර ඇත.

ශ්‍රී ලංකාව තුළද භූමිය සීග්‍ර පිරිහීමට හා හායනයට තුඩු දෙන ප්‍රධානතම ගැටළු ලෙස හඳුනා ගෙන ඇත්තේ වන විනාශය, අවිධිමත් කෘෂිකාර්මික කටයුතු, ධාරිතාව ඉක්මවා සිදු කෙරෙන කැණීම් කටයුතු හා අවිධිමත් කසල බැහැර කිරීම මගින් සිදුවන පරිසර දූෂණය වැනි කරුණුය. මෙම අර්බුදකාරී තත්ත්වයෙන් මිදීම සඳහා බලපෑමට ලක් වූ **භූමි ප්‍රතිෂ්ඨාපනය තුළින් යථා තත්ත්වයට පත් කිරීම හා දැනට හානියට පත් නොවී පවතින පරිසර පද්ධති සංරක්ෂණය උදෙසා කටයුතු කිරීම මූලික වේ. ඒ අනුව,** දේශගුණික විපර්යාසවලට අනුහුරු වීම, ජීවී විශේෂ වඳ වී යාමේ තර්ජනයට පිළියම් යෙදීම, ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම, පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සහ ජීවනෝපායන් පරිසර හිතකාමී ලෙස වැඩි දියුණු කිරීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකාව මෙවර ජගත් පරිසර දිනය **" ඵලදායී භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක්" යන තේමාව පෙරදැරි කර ගෙන** සැමරීම සඳහා සමස්ත ශ්‍රී ලාංකිකයන්ට ආරාධනා කරනු ලැබේ.

මේ සඳහා "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් යුතුව ඉදිරිපත් කර අනුමැතිය ලැබී ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින ජාතික සැමරුමට සමගාමීව **"ජාතික පරිසර සතිය"** 2024 වර්ෂයේ මැයි 30 සිට ජූනි 05 දක්වා ප්‍රකාශයට පත් කරඇති අතර, එම සතියෙහි දිනයන් පහත පරිදි නම් කර ඇත.

- මැයි 30 තිරසර ඉඩම් කළමනාකරණ දිනය
- මැයි 31 වායු දූෂණය හා එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය
- ජූනි 01 ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය
- ජූනි 02 ජෛව විවිධත්වය සංරක්ෂණ දිනය

ජුනි 03 පරිසර පවිත්‍ර කිරීමේ දිනය
ජුනි 04 ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ දිනය
ජුනි 05 රුක්රෝපණය හා ජගත් පරිසර දින ජාතික සැමරුම

මෙයට සමගාමීව ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කරමින් පවතී.ඒ අනුව,

i. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ii. කෘෂිකාර්මික ඉඩම් දීර්ඝ කාලීනව භාවිතා කළ හැකි පරිදි යෙදවීම සම්බන්ධයෙන් ගොවීන් හා වැවිලිකරුවන් දැනුවත් කිරීම.
iii. වන ආවරණය ඉහළ නැංවීමට සඳහා ග්‍රාමීය මට්ටමින් සහ ආයතන මට්ටමින් සුදුසු රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
iv. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
v. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කිරීම
vi. හරිත වෙරළ සංකල්පයට අනුව වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම හා වෙරළ කලාප පවිත්‍ර කිරීම
vii. වෙරළ පරිසර පද්ධති තිරසර කළමනාකරණය හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම
viii. වෙරළ ආශ්‍රිත පරිසරය කලාප තුළ ප්ලාස්ටික් පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා දිරි ගැන්වීම
ix. ලස්සන, පවිත්‍ර රටක් නිර්මාණය කිරීම එක් එක් නිවසින් ආරම්භ කිරීමේ වැදගත්කම සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
x. කාර්යාලයේදී පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට පියවර ගැනීම සඳහා විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම
xi. ප්‍රදේශයට අනුව හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
xii. නිවසේදී කාර්යාලයේදී පාසලේදී ඉවත දමන ලද ප්ලාස්ටික් එකතු කර කසළ පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මීට සමගාමීව ජගත් පරිසර දිනය යෙදෙන ජුනි 05 අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික සැමරුම් උළෙල කලවාන ,කුඩව සිංහරාජ පිවිසුම අසලදී පැවැත්වීමට මූලික කටයුතු සූදානම් වෙමින් පවතී.

එබැවින් ඔබත්, පුරවැසියෙකු ලෙස පරිසර සතිය තුළ ඔබගේ සක්‍රීය දායකත්වය මෙම සත්කාර්යය වෙත යොමු කිරීමෙන් වඩාත් තිරසර අනාගතයක පෙරගමන්කරුවෙකුවීමේ ප්‍රීතිය ඔබට අත්විඳිය හැකිය.

පරිසර අධ්‍යාපන පුහුණු හා විශේෂ ව්‍යාපෘති අංශය

පරිසර අමාත්‍යාංශය